# පර්යේෂණයක සාහිත්‍ය විමර්ශනය

- ඉඹුලමුරේ විමරතන හිමි

## ප්‍රවේශය

විද්‍යාත්මක පර්යේෂණයන්හි අන්තර්ගත පර්යේෂණ ආකෘතීන්හි ප්‍රධාන පර්යේෂණාංගයක් වශයෙන් සාහිත්‍ය විමර්ශනය හැඳින්විය හැකි ය. සමාජීයවිද්‍යා පර්යේෂණ සිදු කිරීමේ දී බොහෝ පර්යේෂණ නිබන්ධයන්හි දෙවන පරිච්ඡේදය විශේෂයෙන් වෙන්කරනු ලබන්නේ සාහිත්‍ය විමර්ශනය සඳහා ය. පර්යේෂණ ක්‍රියාවලියක දී සාහිත්‍ය විමර්ශනය ලිවීම අවසන් කිරීමෙන් පර්යේෂණයේ හරි අඩක් අවසන් කළාක් වැනි සාවද්‍ය හැඟීමක් සමාජ විද්‍යා පර්යේෂකයන් අතර පවතී. සාහිත්‍ය විමර්ශනයේදී පර්යේෂකයා සිය පර්යේෂණය සඳහා තෝරාගන්නා ලද පර්යේෂණ ගැටලුව හෝ උපන්‍යාසය ආශ්‍රිතව පර්යේෂණ ක්ෂෙත්‍රයෙහි පූර්වයෙන් හා සමකාලීනව සිදුකර ඇති පර්යේෂණ හා එමගින් එළඹ ඇති අනාවරණයන් පිළිබඳව ගැඹුරින් හා විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම සිදුකරයි. එහිදී පර්යේෂණ ගැටලුව විශේෂයෙන් වැදගත්වන ආකාරය සාකච්ඡා කරන අතරම පර්යේෂණයේ න්‍යාය, සංකල්ප විග්‍රහ, තොරතුරු, නිගමන යනාදිය පිළිබඳව පර්යේෂකයා දැනුම වර්ධනය කරගනිමින් විචාරාත්මක සංවාදයකට එළඹීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කරගනියි. එමෙන්ම පර්යේෂණය දියත් කිරීමේදී පූර්ව පර්යේෂකයන් මුහුණ දුන් ගැටලු හා අභියෝග පිළිබඳව ද යම් අවබෝධයක් ලබාගත හැකි අතරම පර්යේෂණ පිළිබඳව පවතින දැනුම යාවත්කාලීන කරගැනීමේ හැකියාව ද පර්යේෂකයාට හිමි වේ.

## සාකච්ඡාව

සාහිත්‍ය විමර්ශනයක් යනු කුමක්දැයි විමසීමේදී බ්ලැක්ස්ටර් විසින් කර ඇති ප්‍රකාශය සුවිශේෂී වේ. ඔහු සාහිත්‍ය විමර්ශනයේ අරමුණු ලෙස පර්යේෂණයක ක්‍රියා පිළිවෙත නිශ්චය කිරීම, එහි සංදර්භය හෝ පසුබිමෙහි ආකාරය සහ පසුගිය කාර්යයන් පිළිබඳව අන්තර්ඥානය සපයා ගැනීම දක්වා ඇත (Blaxter,2006:122). මේ අනුව පර්යේෂණය

පිළිබඳ පෙර පැවති පර්යේෂණ කියවීම මගින් පර්යේෂකයාට සිය පර්යේෂණය සඳහා කවරාකාර ක්‍රමවේද යොදාගත යුතුදැයි පැහැදිලි කරගත හැකිය. එමෙන්ම පර්යේෂණ අරමුණු, පර්යේෂණ නියැදිය, දත්ත විශ්ලේෂණය කිරීම ආදිය විමර්ශනය කිරීමෙන් උපදවාගත් අන්තර් ඥානය සිය පර්යේෂණය ඔස්සේ ඵලදායීව නියාමනය කිරීමට පර්යේෂකයා පන්නරයක් ලබයි. ඒ සඳහා පර්යේෂකයා මනා අවධානයකින් යුක්තව පූර්ව පර්යේෂණයන්හි සංදර්භය හා ප්‍රස්තුතය විමසා බැලිය යුතුය. සේනාධීර හා වනසිංහට අනුව සාහිත්‍ය විමර්ශනය යනු පර්යේෂණ ගැටලුව කෙරෙහි බලපාන කරුණු ඊට අදාළව සිදුවී ඇති පර්යේෂණයන් හා ඉදිරිපත්වී ඇති අදහස් ආදිය සොයා බැලීමය (සේනාධිර සහ වනසිංහ, 2016:41). එයට වඩා පුළුල් අදහසක් දක්වන කූපර් සාහිත්‍ය විමර්ශනයේදී සාහිත්‍ය සමාලෝචනයක් සිදුවන බවත්, එහිදී විශ්ලේෂණාත්මක චින්තනය, විවේචනාත්මක හැකියාව හා ආනුභවික ප්‍රවේශය යන ශක්‍යතා පර්යේෂකයා සතුව පැවතිය යුතු බවත්, සාහිත්‍ය සමාලෝචනය සමස්ත පර්යේෂණ ක්‍රියාවලියක සම්පූර්ණ අංගයක් බවත් දක්වයි (Cooper, 1989:28). මේ අනුව සාහිත්‍ය සමාලෝචනයට එහා ගිය ක්‍රියාවලියක් වශයෙන් සාහිත්‍ය විමර්ශනය හඳුනාගත හැකි ය. සාහිත්‍ය විමර්ශනය පිළිබඳව අදහස් දක්වන සරත් ආනන්ද ස්වකීය පර්යේෂණය මගින් ලබාගත් ප්‍රතිඵල ස්ථානගත කිරීමට අවශ්‍ය ඉඩකඩ සකසා ගැනීම හෝ තමන් ගොඩනගන නවමු තර්කය නියෝජනය කරන ආස්ථානය පිළියෙල කර ගැනීම සාහිත්‍ය විමර්ශනයෙන් සිදුවන බව දක්වයි. නිබන්ධයක සාහිත්‍ය විමර්ශනය මගින් තහවුරු වන කරුණු ත්‍රිත්වයක් ඔහු එහිදී දක්වයි. එනම්,

1. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙතෙක් සිදුව ඇති පර්යේෂණවල හිඩැස් නිරීක්ෂණය

2. පර්යේෂකයා අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දක්වන බහුශ්‍රැත හා පරිණතභාවය

3. පර්යේෂකයෙකු නව සොයාගැනීමක් එළිදැක්වීමට අවශ්‍ය තාර්කික පසුබිම සකසා ගැනීමට හා ප්‍රතිතර්ක බිඳ දැමීමට දක්වන ශක්‍යතාව ප්‍රදර්ශනය කිරීම (ආනන්ද, 2019:128) වශයෙනි.

මේ අනුව සාහිත්‍ය විමර්ශනයක මූලික අරමුණ වන්නේ පර්යේෂණය සඳහා ප්‍රස්තුත වූ විෂය ක්ෂේත්‍රය පිළිබඳව මෙතෙක් සිදුකර ඇති අනාවරණයන් ඉස්මතුකර දැක්වීම හා පර්යේෂකයා සොයාගැනීමට බලාපොරොත්තු වන දේ පූර්ව පර්යේෂණයන් හා සම්බන්ධ වන්නේ කෙසේදැයි අවබෝධ කරගැනීම බව පැහැදිලිය. පර්යේෂණයක් විෂයෙහි සාහිත්‍ය විමර්ශනය ප්‍රමුඛ භූමිකාවක් සිදුකරන බවත්, ඉන් පර්යේෂණ කාර්යය විෂයෙහි ලබාදෙනු ලබන පිටුබලය සුවිශාල බවත් හර්ට්ගේ අදහසයි. ඔහුගේ අදහසට අනුව සාහිත්‍ය විමර්ශනය,

- මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ අනාවරණ මගින් පර්යේෂකයා විසින් සිදුකරනු ලබන පර්යේෂණය සුවිශේෂ කොට දක්වයි.
- පර්යේෂණ ගැටලුවට අදාළ සුවිශේෂී විචල්‍යයන් සොයා දෙයි.
- පර්යේෂණයට අදාළ නව පර්යාවලෝකයන් අත්කර දෙයි.
- සංකල්ප සහ භාවිතය අතර සහසම්බන්ධතාව හඳුනාගනියි.
- පර්යේෂණ ගැටලුවේ සන්දර්භය ස්ථාවර කරයි.
- පර්යේෂණ ගැටලුවේ වැදගත්කම සහේතුක කරයි.
- පර්යේෂණ සාහිත්‍යයට අදාළ විෂය ශබ්ද මාලාව ග්‍රහණය කර ගැනීමට සහ වර්ධනය කරගැනීමට අවකාශ සලසයි.
- විෂය ව්‍යුහය අවබෝධ කරදෙයි.
- සංකල්පය සහ න්‍යාය භාවිතය හා සම්බන්ධ කරයි.
- මෙතෙක් පර්යේෂණ ක්ෂෙත්‍රයෙහි භාවිත කර ඇති පර්යේෂණ ක්‍රමවේද සහ පර්යේෂණ ක්‍රම ශිල්ප හඳුනාගනියි. (Hart,1999:24).

මෙහිදී පර්යේෂකයා විසින් තෝරාගන්නා ලද විශේෂිත ගැටලුවට අදාළව සිදුකර ඇති පර්යේෂණ, රචනාකර ඇති විද්‍යාත්මක ලිපි, පොත් පත්, සඟරා හා අනෙකුත් මූලාශ්‍රය පරිශීලනයෙන් සිය පර්යේෂණය සඳහා යෝග්‍යතම න්‍යාය හා දිශානතිය තීරණය කරනු ලබයි. සිය පර්යේෂණය දියත් කරන ක්ෂේත්‍රයේ දළ සැලැස්ම සකස්කර ගැනීමට පර්යේෂකයාට ඉන් හැකියාව ලැබේ. එමෙන්ම පූර්ව පර්යේෂණයන්හි භාවිත ක්‍රමවේද හා එම ක්‍රමවේද භාවිතයේ පවතින ප්‍රබලතා හා දුබලතා පිළිබඳ අවබෝධකර ගැනීමෙන් සිය පර්යේෂණයෙහි පවතින එකී දුබලතා මඟහරවා ගැනීමට මෙන්ම, ප්‍රබලතා සංවර්ධනය කරගැනීමට ඔහු දක්ෂයෙකු බවට පත්වන අතරම පූර්ව පර්යේෂණ සඳහා යොදාගත් විචල්‍ය හා පිහිටුවාගත් උපකල්පනවල පවතින යෝග්‍යතාව හා අයෝග්‍යතාව පිළිබඳ සවිඥානිකවීමට පර්යේෂකයාට හැකියාව ලැබේ. එසේම පර්යේෂකයාට පූර්ව පර්යේෂණයන්හි දත්ත විශ්ලේශනයේදී භාවිත කරන ලද මිනුම් හා ඇගයුම් ක්‍රමයන්හි විශ්වසනීයතාව හා වලංගුතාව ගණනය කරමින්, සිය පර්යේෂණය එකී ඌනතාවන් මගහරවා ගනිමින්, ශක්‍යතා සංවර්ධනය කර ගනිමින්, වඩා ඵලදායී පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම සඳහා යෝග්‍ය අයුරින් දියත් කිරීමට අවශ්‍ය දැනුම වර්ධනය කරගැනීමේ හැකියාව පවතියි. මිලන් පර්යේෂණ සාහිත්‍ය පරිශීලනය කිරීමෙන් පර්යේෂකයා විසින් උකහාගනු ලබන වාසි කිහිපයක් දක්වයි. එනම්,

- පර්යේෂකයාගේ පර්යේෂණ මාතෘකාව සම්බන්ධව වෙනත් පර්යේෂණ සිදුකර ඇති බව දැන ගනියි.
- ස්වකීය පර්යේෂණය මාතෘකාව හා පවතින පර්යේෂණ සාහිත්‍ය අතර පාලමක් සකසයි.
- පර්යේෂකයෙකු ලෙස ස්වකීය පර්යේෂණය පිළිබඳව විශ්වසනීයතාව ගොඩනගයි.
- පර්යේෂණ මාතෘකාවට අදාළ පර්යේෂණ අන්තර්ගතය පිළිබඳ පර්යේෂකයාගේ දැනුම තහවුරු කරයි.
- ස්වකීය පර්යේෂණය නව පර්යේෂණ තත්වයන්ට ආදේශ කළහැකි ආකාරය පිළිබඳ දැනුවත් වෙයි.
- ස්වකීය පර්යේෂණය සඳහා නව අදහස් උත්පාදනය කරයි.

- අන්‍ය පර්යේෂණවල සාර්ථක හා අසාර්ථක තැන් හඳුනා ගනියි.
- ඒ අනුව ස්වකීය පර්යේෂණ ගැටලුව පටුකරගෙන නව පර්යේෂණ උපන්‍යාසයන් ගොඩනගා ගනියි (Millan, 2008:49).

මිලන්ට අනුව සාහිත්‍ය විමර්ශනය මගින් සැලසෙන සුවිශේෂී වාසිය වන්නේ පර්යේෂණ මාතෘකාව හා පවතින පර්යේෂණ සාහිත්‍ය අතර පාලමක් ගොඩනගමින්, නව පර්යේෂණ තත්වයන්ට සිය පර්යේෂණය ආදේශ කරමින්, සිය පර්යේෂණ ගැටලුව පටුකරගෙන නව උපන්‍යාස බිහිකර ගැනීමයි. මීට අමතරව පර්යේෂණ සාහිත්‍ය අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ පරමානන්ද හිමි විසින් ද දක්වා ඇත. එහිදී,

- ස්වකීය පර්යේෂණයට අවශ්‍ය මාර්ග සිතියම පෙර පර්යේෂණ අධ්‍යයනයෙන් හඳුනාගැනීමට හැකියාව ඇතිකරගනියි.
- පෙර අධ්‍යයනවල පර්යේෂණ ප්‍රශ්න හා ක්‍රමවේද සහ පර්යේෂණ ප්‍රතිඵලතා අධ්‍යයනය කරමින්, තෝරාගත් නියැදි කෙරෙහි අවධානය යොමුනොකළ පාර්ශ්ව පිළිබඳ තීරණ ගැනීමට හැකියාව ලැබෙයි.
- ඇතැම් පර්යේෂණවල භාවිත කළ වලංගු මිනුම් උපකරණ සහ දත්ත විශ්ලේෂණ ක්‍රමවේද ස්වකීය පර්යේෂණය විෂයෙහි අදාළ කරගත හැකිය (පරමානන්ද හිමි. 2016: 64).

මේ අනුව සාහිත්‍ය පරිශීලනයෙන් සිය පර්යේෂණයේ දිශානතිය තීරණය කිරීමට පර්යේෂකයාට හැකියාව ලැබෙන අතරම පර්යේෂණ ප්‍රශ්න හා ක්‍රමවේද ද, පර්යේෂණ ප්‍රතිඵලතා ද අධ්‍යයනය කිරීම තුළින් සිය පර්යේෂණය සඳහා මනා ආලෝකයක් සපයාගත හැකිය. එමෙන්ම යම් යම් සාධනීය මිනුම් උපකරණ හා දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයන්හි ඇති අදාළත්වය මත සිය පර්යේෂණය සඳහා එකී ක්‍රමවේදයන්හි ආදර්ශයන් ලබාගැනීමේ හැකියාව ද පවතී. චන්ද්‍රසිරි නිරිඇල්ලට අනුව සාහිත්‍ය විමර්ශනයෙහි අරමුණු පහ කි.

- පර්යේෂණ මාතෘකාව හා ඊට පසුබිම් වන දැනුම ලබාගැනීම.
- මාතෘකාවට අදාළ සංකල්ප හඳුනා ගැනීම, ඒවා අතර ඇති සම්බන්ධතාව අවබෝධ කර ගැනීම සහ පර්යේෂණයට ලක්කළ හැකි උපන්‍යාස සූත්‍රගත කිරීම.
- යෝග්‍ය පර්යේෂණ විධික්‍රමය, පර්යේෂණ සැලැස්ම සහ ශිල්පීය ක්‍රම හඳුනාගැනීම.
- අනෙක් පර්යේෂකයන් විසින් දත්ත රැස්කරගන්නා ලද මූලාශ්‍රය හඳුනාගැනීම.
- අනෙක් විද්‍යාඥයන් සහ පර්යේෂකයන් විසින් ඔවුන්ගේ වාර්තා ලේඛනගතකර තිබෙන අයුරු සහ ඒවායේ ව්‍යුහ දැන ගැනීම (නිරිඇල්ල, 2019:98).

පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය කිරීමෙන් උපමාන ත්‍රිත්වයක් සම්පූර්ණ කරගත යුතු බව ක්‍රෙස්වෙල් දක්වයි.

- සිය පර්යේෂණයට සමාන පර්යේෂණයන්හි ප්‍රතිඵල ගෙනහැර දැක්වීම.
- පර්යේෂණ සාහිත්‍ය පිළිබඳ මතු සංවාද සමග වර්තමාන පර්යේෂණ සම්බන්ධ කිරීම.
- කිසියම් පර්යේෂණයක ප්‍රතිඵල අනෙකුත් පර්යේෂණ සමග සංසන්දනය කිරීමට හැකිවන ආකාරයේ ආකෘතියක් සකස් කිරීම (Creswell,2007:78).

මෙකී උපමානයන්ට අනුව සමාන පර්යේෂණ ප්‍රතිඵල ගෙනහැර දක්වමින් පූර්ව හා සමකාලීන පර්යේෂණ සමග සංසන්දනය කරමින් පූර්ව පර්යේෂණ සමඟ සිය පර්යේෂණ අනාවරණ සම්බන්ධ කරවීම සාහිත්‍ය විමර්ශනයෙන් සිදුවන බව පැහැදිලිය. මෙහිදී පර්යේෂකයා විසින් අනුගමනය කළයුතු පියවර කිහිපයක් ද ක්‍රෙස්වෙල් දක්වා ඇත. එනම් නියමිත පර්යේෂණ සාහිත්‍ය හඳුනාගෙන සෙවීම, පර්යේෂණ සාහිත්‍යයේ ස්ථානගතවීම අධ්‍යයනය කිරීම, පර්යේෂණයට අදාළ වන පර්යේෂණ පරීක්ෂාකාරීව කියවීම, පර්යේෂකයා විසින් තෝරාගන්නා

ලද පර්යේෂණ සාහිත්‍යයේ ප්‍රතිඵල ක්‍රමානුකූලව පෙළගැස්වීම හා පර්යේෂණ විචාරයන් ලිවීම සිදුකළ යුතු බවයි (Creswell,2007:78).

පර්යේෂණ සාහිත්‍යය සොයාබැලීමේ ක්‍රියාමාර්ග කිහිපයක් චන්ද්‍රසිරි නිරිඇල්ල ද දක්වයි. එහිදී ඔහු පර්යේෂකයෙකු විසින් සිය පර්යේෂණයට අදාළව සාහිත්‍ය විමර්ශනය සිදුකිරීමේදී කළයුතු පියවරයන් කිහිපයක් යෝජනා කරයි.

- අදාළ ක්ෂේත්‍රය පිළිබඳව මනා දැනුමක් සහිත මහාචාර්යවරයෙකුගෙන් උපදෙස් ලබාගැනීම.
- අදාළ සාහිත්‍යය හෝ ග්‍රන්ථවල හෝ නිර්දේශ කර තිබෙන ආශ්‍රිත ග්‍රන්ථ මාලාව (bibliography) පරිශීලනය කිරීම.
- පුස්තකාලවල දැනටමත් සකස්කර තිබෙන ග්‍රන්ථ ලේඛන සහ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලි ඃඉසඉකසදටර්චයසජ index) පරීක්ෂාවට ලක්කිරීම.
- පුස්තකාලවල කාඩ්පත් නාමාවලිය (bcard catalogies) හෝ පරිගණක විස්තර නාමාවලි (කර්තෘ, නම අවුරුද්ද, ග්‍රන්ථය හෝ පර්යේෂණ ලිපිය පිළිබඳ විස්තර) පරීක්ෂා කිරීම.
- සඟරා ලිපි (periodicals) එක් අංශයක් හෝ විෂයක් හෝ ගැන පමණක් ලියවුණු කුඩා ග්‍රන්ථ (monography) වාර්තා සහ සම්මන්ත්‍රණ මූලාශ්‍රය පරිශීලනය කිරීම.
- නිර්දේශිත ග්‍රන්ථවල සහ පර්යේෂණ ලිපිවල උපුටා දැකිවීම් (cited references) සෝදිසි කිරීම.
- විෂය සම්බන්ධ සඟරාවල සංක්ෂේප (abstracts) කියවීම.
- සඟරාවල සහ පුවත්පත්වල නව ග්‍රන්ථ පිළිබඳව ඉදිරිපත්කර ඇති ග්‍රන්ථ විමර්ශන (boock reviews) පිටු කියවීම. (නිරිඇල්ල, 2019:99).

මේ අනුව සාහිත්‍ය විමර්ශනයේදී පර්යේෂණයේ මාතෘකාවට අදාළව ශාස්ත්‍රීය සාහිත්‍යය සමග විචාරාත්මක සංවාදයකට යොමුවීමේදී මූලිකවම මාතෘකාවට අදාළ සාහිත්‍ය පිළිබඳව පුළුල් ග්‍රන්ථ නාමාවලියක් සකස්කර ගැනීම සිදුකළ යුතුය. මෙහිදී තම පර්යේෂණයට අදාළ සාහිත්‍ය කෘති හා පර්යේෂණ නිබන්ධ පිළිබඳව අවධානය යොමුකරමින් මුද්‍රණය වී ඇති ග්‍රන්ථ හා ශාස්ත්‍රීය සඟරාවල ලිපි ද, මුද්‍රණය නොවී ඇති අත් පිටපත් වාර්තා ආදිය ද පරිශීලනය කළ යුතුය. මෙහිදී දේශීය සාහිත්‍යය, විදේශීය සාහිත්‍යය, න්‍යායික සාහිත්‍යය, ආනුභවික සාහිත්‍යය, මුද්‍රණය නොවූ සාහිත්‍යය වශයෙන් අංශ කිහිපයක් ඔස්සේ අවධානය යොමු කළ යුතුය. සාහිත්‍ය විමර්ශනය ගුණාත්මක බවින් ඉහළ මට්ටමකට පැවතීමට නම් එය තේමාත්මක ව්‍යූහයක් ඔස්සේ සංවිධාන කොට ඉදිරිපත් කළයුතු බව ජයදේව උයන්ගොඩ දක්වන අතර එකී තේමාවන්, විමර්ශනය කරන සාහිත්‍යය තුළින්ම උත්පන්න විය යුතු බවත්, තේමාත්මක වශයෙන් සිදුකරන වර්ගීකරණය පර්යේෂකයාගේ පර්යේෂණ කුසලතා ප්‍රදර්ශනය කරන්නක් බවත් දක්වයි (ජයදේව උයන්ගොඩ, 2016:89). මේ අනුව සාහිත්‍ය විමර්ශනය වනාහි පර්යේෂණයක අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් හඳුනා ගත හැකි ය.

**සාහිත්‍ය විමර්ශනයක මූලාශ්‍ර භාවිතය**

පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයේදී ඉතා වැදගත් කාර්යයක් වන්නේ මූලාශ්‍රය යොදාගැනීමයි. ඒ සඳහා මනා ඉවක් පර්යේෂකයා සතු විය යුතුය. එකී ඉව මගින් සිය පර්යේෂණය සඳහා යෝග්‍යතම මූලාශ්‍රය හඳුනාගැනීමට පර්යේෂකයාට හැකියාව ලැබේ. සමාජීයවිද්‍යා හා මානවවිද්‍යා පර්යේෂණයන්හිදී ලිඛිත හා වෙනත් මූලාශ්‍රය භාවිතය මගින් පර්යේෂණයේ සුවිශේෂී වැදගත්කම විදහා දැක්විය හැකිය. පර්යේෂණ සාහිත්‍යයේ පවතින හිඩැස මූලාශ්‍රය භාවිතයෙන් මනාව හඳුනාගැනීමේ හැකියාව පවතී. මූලාශ්‍රය වර්ග ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වෙන්කළ හැකි ය. එනම්, ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය වශයෙනි.

**ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය**

පර්යේෂණය සඳහා යොදාගනු ලබන මූලාශ්‍රය ප්‍රධාන කොටස් දෙකකි. එනම් ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීය මූලාශ්‍රයයි. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යම් කෘතියක් හෝ ලේඛනයක් සකස්කරන ලේඛකයා තමාම ප්‍රත්‍යක්ෂයෙන් යමක් අවබෝධකරගෙන කෘතිය රචනා කරන්නේ නම් එය ප්‍රාථමික මූලාශ්‍රයකි. ''මම මෙය දැක්කා'', ''මට මෙය අවබෝධ වුණා'', ''මට ප්‍රත්‍යක්ෂයි'' වශයෙන් රචනා කරන ලේඛනය ප්‍රාථමික ලේඛනයකි. ඓතිහාසික පර්යේෂණයක දී පර්යේෂකයා විසින් සොයාගනු ලබන නෂ්ටාවශේෂ, අස්ථි කොටස්, ආයුධ, මැටි හා පිත්තල ආදී භාජන, උපකරණ, ඇඳුම්-පැළඳුම්, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, පින්තූර, බිතු සිතුවම් හා කාසි ආදී ද්‍රව්‍යයන් ද ප්‍රාථමික මූලාශ්‍රය ලෙස හඳුන්වයි. එමෙන්ම යම් සිදුවීමක්, යම් පුද්ගලයෙක් හෝ කාල වකවානුවක් පිළිබඳව සියැසින් දැක ලියන ලද ලේඛන ද, මුඛ පරම්පරාගතව පැමිණ ග්‍රන්ථාරූඪ වූ කරුණු ද, ප්‍රාථමික ලේඛන ගණයට අයත් වේ. ප්‍රාථමික මූලාශය ලෙස ශබ්දකෝෂ, විශ්වකෝෂ, ශිලා ලිපි, ග්‍රන්ථ, වාර්තා, සහතික, ව්‍යවස්ථා නීති, නඩු තීන්දු, දිනපොත්, කොන්ත්‍රාත්, අන්තිම කැමති පත්‍ර, ඔප්පු, ස්වයං ලිඛිත චරිතාපදාන දැක්විය හැකි ය.

ද්විතීය මූලාශ්‍රය වශයෙන් තමා ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ නොකළ දෙයක් ප්‍රකාශ කිරීමේදී භාවිත කරන ලේඛන දැක්විය හැකිය. එහිදී 'අසවලා මෙසේ කියා තිබුණා', 'අසවල් පොතේ මෙසේ සඳහන් වුණා.' 'මට මෙය අසවලා විසින් කියුවා, 'අසවලාගේ පොතේ සඳහන් වූවා' වශයෙන් ප්‍රකාශ කරන මූලාශ්‍රය ද්විතීය මූලාශ්‍රය ගණයට අයත්ය(නන්දසේන රත්නපාල, 2015:71). මේ අනුව අන්‍යයන්ගේ කෘති විස්තරකර හෝ සාරාංශකර ඇති දෙවන පෙළ තොරතුරු සඳහන් කෘති ද්විතීයික මූලාශ්‍රය නම් වේ. එමෙන්ම ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් සකස්වූ ග්‍රන්ථ ද ද්විතීයික මූලාශ්‍රයවලට අයත් වේ. ඇතැම් විට ද්විතීයික මූලාශ්‍රය ප්‍රාථමික මූලාශ්‍රය ආකාරයෙන් ද දක්නට ලැබේ.

යම් මූලාශ්‍රයක් ප්‍රාථමික මූලාශ්‍රයක් හෝ ද්විතීයික මූලාශ්‍රයක්

බවට පත්වන්නේ පර්යේෂණ කාර්යයේදී පර්යේෂකයා එය යොදන ආකාරය අනුවය. යම් ප්‍රස්තුතයකදී ප්‍රාථමික මූලාශ්‍රයක් වන කෘතියක් ඇතැම් අවස්ථාවකදී ද්විතීයික මූලාශ්‍රයක් බවට පත්විය හැකි ය. එය එකී මූලාශ්‍රය භාවිත කරන ආකාරය මත තීරණය වේ. උදාහරණයක් ලෙස 'බ්‍රොහියර් දුටු ලංකාව' නැමැති කෘතියේ ඔහු විසින් සිරිපාදය වන්දනා කොට ඒ පිළිබඳව රචනාකර ඇති තොරතුරු ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස යොදා ගත හැකි ය. නමුත් ඔහු සිරිපාදය වන්දනා කිරීමට නොගොස් වෙන වන්දනාකරුවෙකු විසින් ප්‍රකාශ කරන ලද තොරතුරු සිය වාර්තාවල සටහන් කළේ නම් එය ද්විතතීයික මූලාශ්‍රයක් බවට පත් වේ. පර්යේෂණයකට අවශ්‍ය තොරතුරුවලින් බොහෝ ප්‍රමාණයක් ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් ලබාගැනීමේ හැකියාව පවතී. ද්විතීයික මූලාශ්‍රයක අවසානයේ දක්වා ඇති ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය පරිශීලනයෙන් පර්යේෂකයකුට සිය පර්යේෂණය සඳහා අවශ්‍ය ද්විතීයික මූලාශ්‍රය හඳුනාගැනීමේ හැකියාව පවතී.

### විද්‍යුත් දත්ත මූලාශ්‍ර

වර්තමානයේ පර්යේෂණ ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට ඉතාමත් පහසු දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයක් ලෙස අන්තර්ජාලය දැක්විය හැකි ය. අන්තර්ජාලගත විද්‍යුත් දත්ත සංචිත ක්‍රමානුකූලව ගොනු ගත කර ඇති හෙයින් පර්යේෂණ මාතෘකාවේ නම සඳහන් කළ පමණින් පර්යේෂකයාට මාතෘකාව හා සම්බන්ධ සියලු ලිපි ගොනු හා සියලු තොරතුරු සොයා ගත හැකි ය. ඉන් තමාට අවශ්‍ය මාතෘකාව සහිත ලිපිය කියවා අවශ්‍ය නම් පරිගණකයේ හෝ විද්‍යුත් තැපැලයේ තැන්පත් කරගත හැකි ය.

විවිධ විෂයන් ඔස්සේ විවිධ මාතෘකාවන්ට අයත් විද්‍යුත් දත්ත ගබඩා අන්තර්ජාලයෙහි පවතින අතර ඒවා විවිධ භාෂාවන්ගෙ න් රචනාකර ඇත. බොහෝ ලිපි රචනාකර ඇත්තේ ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂාවෙනි. ඇතැම් පර්යේෂණ සම්පූර්ණ පෙළ සහිතවම මුද්‍රණය වූ වෙබ් පිටු (pdf) මාදිලියෙන් පවතී.

එබඳු මාදිලියේ ආකෘති ලිපි බාගතකර ගැනීමේ පහසුව පර්යේෂකයාට පවතී. මෙකී ලිපි බාගත කිරීමට ඇතැම් අවස්ථාවල විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර ඇතැම් විශ්වවිද්‍යාල මගින් එකී පර්යේෂණයන් ස්වකීය පුස්තකාල පරිශ්‍රයේ පමණක් පරිහරණය කිරීමට හැකිවන ලෙස සීමා කොට නොමිලේ ලබාදී ඇත.

විවිධ විෂයක්ෂේත්‍රයන් අරභයා රචිත අන්තර්ජාතික දත්ත ගබඩා පවතී. නිදසුන් වශයෙන්, ERIC, Education Full Text යන දත්ත ගබඩාවන්හි අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ ද, ABI /Inform දත්ත ගබඩාවේ ව්‍යාපාර කළමනාකරණ හා ආර්ථික විද්‍යාව පිළිබඳව පර්යේෂණ ලිපි ද, සාහිත්‍ය හා භාෂාව සම්බන්ධ පර්යේෂණ ලිපි Literature Resource Center නැමැති දත්ත ගබඩාවේ ද, MLA, International Bibliography දත්ත ගබඩාවේ විවිධ සඟරා, ලිපි, සංක්ෂේපන හා උධෘත දහස් ගණනක් ද, ඉතිහාසය විෂය හා සම්බන්ධ පර්යේෂණ Historical Abstracts දත්ත ගබඩාවේ ද, නීතිය සම්බන්ධ පර්යේෂණ Legal Trac, Legal Periodicals full text දත්ත ගබඩාවල ඇතුළත් වේ (පරමානන්ද හිමි, 2015: 68-71). මෙසේ විවිධ විෂයන් අරභයා සිදුකරන ලද පර්යේෂණ පිළිබඳව තොරතුරු ඉතා පහසුවෙන් අන්තර්ජාලයට පිවිසීමෙන් පර්යේෂකයන්ට ලබාගත හැකි ය.

විවිධ පර්යේෂණයන්හි පවතින තොරතුරු සිය පර්යේෂණ කාර්ය සඳහා ආධුනික පර්යේෂකයෙකු විසින් යොදාගැනීමේදී එකී තොරතුරු තාර්කිකව විග්‍රහ කළ යුතුය. එකී තාර්කික විග්‍රහය ප්‍රධාන කරුණු හතරක් ඔස්සේ සිදු කළ හැකි බව ස්ටුවට්ගේ අදහස යි.

1. කර්තෘ තමා විසින් කරන නිගමනය මගින් බලාපොරොත්තු වන්නේ කුමක් ද? එහි පෙනෙන අර්ථයට වඩා සැඟවුණු අර්ථයක් පැවතියේ ද ?

2. ඒ නිගමනය හෝ නිරීක්ෂණය සිදුකොට ඇත්තේ කුමන අදහසකින් ද?

2. 1. කියවන්නා නොමග යැවීමට ඔහු තුළ අදහසක් පැවතියේ ද?

2. 2. අසත්‍යයක් ප්‍රකාශ කිරීමට කර්තෘට යම්කිසි බාහිර බලපෑමක් පැවතියේ ද?

2. 3. අසත්‍ය කීමට තරම් හේතුවන යම්කිසි අනුකම්පාවක් හෝ විරුද්ධතාවක් පැවතියේ ද?

2. 4. අසත්‍ය කරුණු පැවසීමට තරම් හේතුවන ආඩම්බරයක් හෝ පුහු අවබෝධයක් ඔහුට පැවතුණි ද?

2. 5. එකල මහජන මතය ඔහුට පැවතියේ ද?

2. 6. සාහිත්‍යමය හෝ කාව්‍යමය පරමාර්ථ නිසා සත්‍යය යටපත් කිරීමට ඔහු වෑයම් කළ බවට සාක්ෂි පවතී ද ?

3. කර්තෘ ඉදිරිපත් කළ නිගමනය හෝ නිරීක්ෂණය නිරවද්‍ය එකක් ද?

3. 1. යම් දෙයක් හරිහැටි නිශ්චය කිරීමට නොහැකි අවස්ථාවක හෝ කාලයක ඔහු ජීවත් වුණි ද?

3. 2. නිරීක්ෂණය කිරීමේදී ඔහු නොසැලකිලිමත් වී ද?

3. 3. ඔහු නිරීක්ෂණය කරනු ලබන කාරණය හරිහැටි අවලෝකනය කිරීමට ඔහුට බලපෑ යම් යම් නිසර්ග හෝ කෘත්‍රිම බාධක පැවතියේ ද ?

3. 4. ලේඛකයා, හෝ නිරීක්ෂකයා යම් දෙයක් අක්‍රියව බලා සිටි සාක්ෂිකාරයෙක් ද? නො එසේ නම් යම්කිසි අන්දමක නිරීක්ෂණය පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් ලැබූ අයෙක් ද?

4. කර්තෘවරයා සහ ලේඛකයා තමා සඳහන් කරන කරුණු ප්‍රත්‍යක්ෂ වශයෙන්ම හෝ කෙළින්ම දැක නැත්තේ නම් ඔහුගේ ලේඛනයේ අන්තර්ගත කරුණුවල නිරවද්‍යතාව මැනගැනීමට හැකි ඔහු විසින් සඳහන් කරනු ලබන මූලාශ්‍රය හා සාධක හා සම්බන්ධ වෙනත් කරුණු මොනවාද ? (Chapin, 37:38).

මෙකී ප්‍රධාන කරුණු හතර ඔස්සේ යම් කරුණක් ගවේෂණය කිරීමෙන් පර්යේෂකයාට ඉතා සියුම් ලෙස සොයාගත් පර්යේෂණ තොරතුරු විමර්ශනය කරමින් පර්යේෂණය සඳහා යෝග්‍යතම තොරතුරු සිය පර්යේෂණ කාර්යය විෂයෙහි උපයුක්ත කරගත

හැකිය. එසේ උපයුක්ත කරගත් තොරතුරු මනාව පෙළගැස්වීම ද පර්යේෂකයාගේ දක්ෂතාවකි. සාහිත්‍ය විමර්ශනය රචනයේදී සිය පර්යේෂණ ගැටලුව හා පර්යේෂණ අරමුණු හා සම්බන්ධ නොවන තොරතුරු ඉවත්කිරීමට ද පර්යේෂකයා දක්ෂ විය යුතුය. නොඑසේනම් සාහිත්‍ය විමර්ශනය අනවශ්‍ය වැල්වටාරම්වලින් යුක්ත රචනයක් බවට පත්වේ. තෝරාගන්නා ලද තොරතුරු ද ඇගයීමට ලක්කර විචාරාත්මකව කරුණු පෙළ ගැස්විය යුතුය. විචාරාත්මකව කරුණු ගොඩනැගීමේදී අනුගමනය කළයුතු කරුණු 10 ක් ජෙසන් සහ ජිල් දක්වා ඇත. එනම්,

- අනුශීර්ෂ භාවිතයෙන් විචාරය සංවිධානගත කරන්න.
- පර්යේෂණ ප්‍රශ්නවලට පවත්නා පර්යේෂණ සාහිත්‍යය කොතෙක් දුරට පිළිතුරු සැපයිය හැකිදැයි ප්‍රකට කරන්න.
- එක පර්යේෂණයක හෝ එක පර්යේෂකයෙකුගේ අදහස් එක් එක් ඡේදය හෝ ඡේද යටතේ ඉදිරිපත් කරන්න.
- පර්යේෂණ තොරතුරු, සංකල්ප, අදහස්, මාතෘකා, ක්‍රම ශිල්ප ආදී වශයෙන් බෙදා දැක්වීමෙන් අවුල් සහගත බව මගහරවා ගන්න.
- පර්යේෂණ තොරතුරු සාරාංශ ගතකොට ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවල උද්ධෘත වශයෙන් ඉදිරිපත් කිරීමෙන් රචනා චෞරත්වයෙන් වැලකිය හැකිය.
- මූලික අදහස් සාරාංශ කර ගැනීමෙන් එකී අදහස්වල සහසම්බන්ධතාව හා ප්‍රතිවිරුද්ධතාව ප්‍රකට කළ හැකිය.
- පර්යේෂණ සිද්ධාන්තයක් පවතින්නේ නම් ස්වකීය පර්යේෂණ මාතෘකාවට අදාළව එකී සිද්ධාන්තය පර්යේෂණ සාහිත්‍ය තුළ කෙතෙක් දුරට පරීක්ෂාකර ඇත්දැයි විමසන්න.
- පර්යේෂණ සාහිත්‍යය විචාරය යාවත්කාලීන තොරතුරු මත පදනම් වී ඇත්දැයි පරීක්ෂාකාරී වන්න.
- පවතින පර්යේෂණ සාහිත්‍යයෙන් තෝරාගත් පර්යේෂණ

කෙරෙහි අගතිගාමීත්වයක් ප්‍රදර්ශනය නොවන බව ප්‍රකාශ විය යුතු අතර පාර්ශ්වික නොවිය යුතුය.

- පර්යේෂණ හිදැස, සංකල්පීය හිඟතාව සහ න්‍යායේ අභාවිතය ඉස්මතු කළ යුතු අතර ස්වකීය පර්යේෂණය සමග පරිවාර පර්යේෂණවල සම්බන්ධය තහවුරු කිරිම ද අවශ්‍ය වෙයි. (Jesson, Jill and Flona, 2006:139-148).

මෙම උපදෙස් අනුව කටයුතු කිරීමෙන් වඩා ඵලදායී සාහිත්‍ය විමර්ශනයක් සම්පාදනය කිරීමේ හැකියාව පවතී. සාහිත්‍ය විමර්ශනය. විචාරාත්මකව රචනා කිරීමේදී මුළුමනින්ම වාක්‍ය උපුටනයන් නොදක්වා සිය වචනවලින් එකී අදහස ප්‍රකාශ කිරීම වඩා යෝග්‍යය ය. පර්යේෂකයා විසින් ලබාගන්නා අදහස්වල බුද්ධිමය අයිතිය සුරැකෙන අයුරින් කරුණු දැක්වීම ශිෂ්ට සම්පන්න ක්‍රමවේදය වේ. එහිදී කතෘගේ නමෙහි මුල් කොටස, වර්ෂය හා අදාළ පිටුව පඨිතය තුළ දැක්වීම අත්‍යාවශ්‍යයෙන් සිදුවිය යුත්තකි. මෙහිදී පර්යේෂකයාගේ තර්කයට අනුගත වූ තර්කය වේ නම් එකී තර්කය මුලින් ඉදිරිපත් කොට පර්යේෂකයාගේ තර්කයට ප්‍රතිපක්ෂ වූ තර්ක පසුව ඉදිරිපත් කිරීම වඩා යෝග්‍ය වේ. මෙමගින් සිය තර්කය පරිපූර්ණත්වයට පත්වන්නේ නැත. සමගාමී තර්ක හා ප්‍රතිතර්ක ඉදිරිපත් කරමින් හා විශ්ලේෂණය කරමින් සිය අදහස තහවුරු කිරීමට කරුණු ඉදිරිපත් කළ යුතුය. මෙවිට විචාරාත්මක හා තර්කානුකූල සාහිත්‍ය විමර්ශනයක් බිහිවේ.

**සමාලෝචනය**

මේ අනුව පර්යේෂණයක, පර්යේෂණ ගැටලුව සම්බන්ධයෙන් පූර්ව හා සමකාලීන පර්යේෂණ සාහිත්‍ය තර්කානුකූලව ඉදිරිපත් කිරීමෙන් සාහිත්‍ය විමර්ශනය වියමන් රටාවක් සේ ගොඩනැගෙන අතර එකී පර්යේෂණ සාහිත්‍ය ඇසුරින් පර්යේෂකයා සිය පර්යේෂණ ගැටලුව සුවිශේෂීව හඳුනාගනී. එම සුවිශේෂී ගැටලුව පර්යේෂණ ක්ෂේත්‍රයේ සිය පර්යේෂණයට හිමි හිඩැස වන අතර එකී හිඩැස පිරවීම පර්යේෂකයාගේ කාර්ය වේ. එසේම සාහිත්‍ය විමර්ශනයේ ප්‍රධාන අංගයක් වන මූලාශ්‍රය භාවිතය ද සම්මත විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ සිදුකළ යුතු ය. මේ අනුව වලංගුතාව හා විශ්වසනීයතාව

සුරැකෙන ලෙස සුපරීක්ෂාකාරීව සාහිත්‍ය විමර්ශනය සිදු කිරීම මගින් පර්යේෂණය ගුණාත්මක බවින් යුතු විද්‍යාත්මක පර්යේෂණයක් බවට පත් කර ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අබේපාල, රෝලන්ඩ් (2015). **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.** කොට්ටාව : සාර ප්‍රකාශන.

ආනන්ද, සරත් (2019). **සමාජීය විද්‍යා පර්යේෂණ හා විද්‍යාත්මක රචනය.** කොළඹ : ෆස්ට් පබ්ලිෂින්.

උයන්ගොඩ, ජයදේව (2019). **සමාජීයවිද්‍යා පර්යේෂණ යෝජනාවක් ලිවීම.** න්‍යායික හා ප්‍රායෝගික මග පෙන්වීමක්, කොළඹ : සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.

නිරිඇල්ල, චන්ද්‍රසිරි (2019). **නාගරික පර්යේෂණ විධික්‍රම.** නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ.

පරමානන්ද හිමි, පොල්වත්තේ, (2016). **පර්යේෂණ නිබන්ධ අත්පොත.** කොළඹ: සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, ඥානදාස, (2017). **පර්යේෂණ ක්‍රම විද්‍යාව.** කොළඹ: සහස්‍ර ප්‍රකාශකයෝ.

රත්නපාල, නන්දසේන, (2015). **සමාජවිද්‍යා පර්යේෂණ මූලධර්ම.** කොළඹ: සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාධීර, සිල්වි සහ වනසිංහ, ශාමින්ද (2016). **පර්යේෂණ ක්‍රමවේදය.** කොළඹ : සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Blaxter, Lorain.Hughes,Christina. & Tight Malcolm (2006) **How to Research**, (3rd ed), London: Library of Cogress Catalogin in Publication.

Cooper, H. M. (1989) **Integrating Research**: a Guide for Literature Reviews, (2nd Ed), Newbury Park, Sage Publications,

Cresswell, J.W.(2003) **Research Design Qualitative and Quantitative approaches**, ( 2nd ed.) CA, thousand Oaks; Sage publications.

McMillan, J. (2008). **Educational Research. Fundamentals of the Consumer** (5th ed.). Virginia Commonwealth University. NY: Pearson Education Inc.

Jesson, Jill and Flona (2006). **How to Do (or not to do) a Critical**

**Literature Review**. vol 6, No.2, Pharmacy education.

Hart,C.(1999) Doing a literature review; Releasing the Social science research imagination, London: SAGE journles.

Start Chapin. F. (1974), **The Costs of sprawl: Litereture Review and Bibiliography Retrieved**: May 22 2019 from (https://booksgoogle.lk/books)